# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1,639/13 - 2010 පෙබරවාරි 02 වැනි අඟහරුවාදා - 2010.02.02

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත

නියමය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ, 9අ වැනි වගන්තියේ (අ) සහ (ආ) ඡේදවලින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍ය, ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම, 1987 මැයි මස 12 දිනැති අංක 453/8 දරන අතිවිශෙෂ ගැසට් පත්‍රයේ පළකරන ලද දඹුල්ල ප්‍රාදේශීය සභාව සංස්ථාපනයට අදාළ නියමය, මෙම නියමයෙන් -

(1) එහි උපලේඛනය ඉවත් කර ඒ වෙනුවට මෙහි උපලේඛනය ආදේශ කිරීමෙන් සංශෝධනය කරමි ;

(2) (අ) එහි (4) වන ඡේදයේ සඳහන් "නව" යන පදය ඉවත් කර ඒ වෙනුවට "දහතුන් " යන පදය ආදේශ කිරීමෙන් සංශෝධනය කරමි ; සහ

(ආ) මෙම නියමය 2011 අප්‍රේල් මස පළමුවන දින සිට බලාත්මක විය යුතු යැයි නියම කරමි.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍ය.

2010 පෙබරවාරි මස 02 වැනි දින,
කොළඹ,
පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශයේ දී ය.

උපලේඛනය

***I* වැනි කොටස**

*මාතලේ දිස්ත්‍රික්කයේ දඹුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටි පහත සඳහන් ග්‍රාම නිලධාරි කොට්ඨාසවලින් සමන්විත භූමි ප්‍රදේශය :*

(400) ඇඹුල්අඹේ, (440ඒ) ඇතාබැඳිවැව, (440බී) කිරලගොල්ල, (440සී) වවුල්අඹේ, (440ඩී) වැලමිටියාව, (441) ලේනදොර උතුර, ( 441ඒ) පන්නම්පිටිය, (441බී) ලේනදොර දකුණ, (441සී) කිරිලැස්ස, (441ඩී) පුවක්අත්තාවල, (442) නයාකුඹුර, (442ඒ) වල්ගම්වැව, (443) කළුන්දැව පරණගම, (443ඒ) කළුන්දැව අලුත්ගම, ( 443බී) අඟුණවැල්පැලැස්ස, ( 446) පහළ ඇරැවුල, (446ඒ) යක්කුරාගල උතුර,

1A - G 12388— 1,000 (2010/02)

(446 බී) කලෝගහඇල, (446සී) ඉහල ඇරැවුල, (446ඩී) වෙලන්ගොල්ල, (446ඊ) යක්කුරාගල දකුණ, (446එෆ්) විල්හත, (447) නිකවටවන, (447ඒ) වැවලවැව, (448) කුඹුක්කඳන්වල, (449) කණ්ඩලම, (450) පල්ලේගම, (450සී) වැලිහේන, (451) ඉනාමළුව (451ඒ) වෙල්ලන්නේ ඔය, (451බී) ඇටවරාහේන, (451සී), රත්මල්කටුව, (452) පලුමාව, (452ඒ) කිඹිස්ස, (452බී) එගොඩවැව, (452සී) පොතාන (453) අවුඩන්ගාව, (453ඒ) දිගම්පතහ, (453බී) නාගලවැව, (453සී) සියඹලාවැව, (454) ගෙඩිගස්වලාන, (455) සීගිරිය, (455ඒ) තල්කොටේ, ( 455බී) පොල්අත්තාව (455සී) පිදුරංගල සහ (455ඩී) මයිලත්තැව.

## *II වැනි කොටස*

*දඹුල්ල ප්‍රාදේශීය සභාවේ පරිපාලන සීමා* :

***උතුරට .***— උතුරුමැද සහ මධ්‍යම පොදු පළාත් මායිමේ පිහිටි ඉනාමළුව කඳු මුදුනේ සිට උතුරට මීටර් 800ක් ගියතැන හමුවන ඉහත කී පළාත් මායිමේ ලක්ෂ්‍යයේ සිට නැගෙනහිර දෙසට ගියතැන හමුවන අනුරාධපුර පොළොන්නරුව දිස්ත්‍රික් වෙන්වන ලක්ෂ්‍යය දක්වා ද, (එනම් නඹඩගල දක්වා ද ) එතැන් සිට උතුරු මැද සහ මධ්‍යම පොදු පළාත් මායිම දිගේ නැගෙනහිර දෙසට ගියතැන හමුවන කිරිඔයේ මධ්‍ය ලක්ෂ්‍යය දක්වා ද, එතැන් සිට නැගෙනහිර දෙසට උතුරුමැද සහ මධ්‍යම පොදු පළාත් මායිම දිගේ මීටර් 4800 ක් දක්වා ද,

***නැගෙනහිරට .***— ඉහත කී අවසාන ලක්ෂ්‍යයේ සිට උතුරුමැද සහ මධ්‍යම පොදු පළාත් මායිම දිගේ දකුණු දෙසට හැරී හීරට්ඔය අමුණ හමුවන ලක්ෂ්‍යය දක්වා ද,

***දකුණට .***—ඉහත කී අවසාන ලක්ෂ්‍යයේ සිට මීටර් 800ක් හීරට්ඔය දිගේ වයඹ දෙසට පැමිණ එතැන් සිට උතුරුමැද සහ මධ්‍යම පොදු පළාත් මායිම දිගේ බස්නාහිර දෙසට මීටර් 1600ක් ද, එතැන් සිට මීටර් 800 ක් උතුරු දෙසට ද, එතැන් සිට නිරිත දෙසට කඳුබඩයාය කඳු මුදුන උඩින් මීටර් 8000ක් ගිය තැන හමුවන වැහිගල කඳුමුදුන උඩින් ගොස් එතැන් සිට දකුණට ගෙදරගල්පතන කඳුමුදුන දක්වා ද, එතැන් සිට පිළිවෙලින් උඩහාඩුව, සේරුදණ්ඩාපොල, කරවිලහේන, නිකුල, උස්අත්තාව යන ගම්වල මායිම් ගල් දමා වෙන් කර ඇති උතුරු ගම් මායිම් දිගේ මලඔය මධ්‍ය ලක්ෂ්‍යය දක්වා ද,

***බටහිරට .***— ඉහත කී අවසාන ලක්ෂ්‍යයේ සිට එම ඔය දිගේ උතුරු දෙසට මීටර් 4800ක් ගිය තැන හමුවන (මායිම් ගල් යෙදූ ) පහළ වැව ගම් මායිමට වැටී එතැනින් පිළිවෙලින් පහළවැව තලකිරියාගම නැගෙනහිර (මායිම් ගල් යෙදූ ) ගම් මායිම දිගේ ගොස් දඹුලුඔයේ මධ්‍ය ලක්ෂ්‍යයට වැටී එම අවසන් ලක්ෂ්‍යයේ සිට දඹුලු ඔය මධ්‍ය රේඛාව දිගේ ගිනිකොණ දෙසට ගියවිට හමුවන අක්කරසීය මාර්ගය හා ඇඹුල්අඹේ මායිම පසුකර නැවතත් දඹුලු ඔය මධ්‍ය රේඛාව දිගේ ගිනිකොණ දෙසට ගියවිට හමුවන මාතලේ - දඹුල්ල ප්‍රධාන මාර්ගයේ මධ්‍ය රේඛාව දක්වා ද, එතැන් සිට නැවතත් දඹුලු ඔය මධ්‍ය රේඛාව ඔස්සේ ගිනිකොණ දෙසට ගියවිට හමුවන කිරලැස්ස සහ ඇඹුල්අඹේ ගම් මායිම් හමුවන මැදමුල්ල ඇළ දක්වා ද, එතැන් පටන් මැදමුල්ල ඇළ මධ්‍ය රේඛාව ඔස්සේ නැගෙනහිර දෙසට ගියවිට හමුවන ලකී ගාමිණී සේනානායක හිමිකම් කියන දියබුබුල වත්ත හා මරවනාගොඩ හිමිකම් කියන එම්. පී. එස්. වත්ත පොදු මායිම දිගේ උතුරු දෙසට ගිය විට හමුවන දඹුලුඔය - කලුන්දෑව මාර්ගයේ මධ්‍ය රේඛාවට පැමිණ, නැවත එම මාර්ගය දිගේ නැගෙනහිර දෙසට ගියවිට හමුවන පල්ලියගුරු හිමිකම් කියන නඩුකාරවත්ත ද, මරවනාගොඩ හිමිකම් කියන එම්. පී. එස්. වත්තේ ද පොදු මායිම් දිගේ උතුරු දෙසට ගිය විට හමුවන කලෝගහ ඇළ හා කිරලැස්ස ගමෙහි මායිම් ගල් යෙදූ මායිමට පැමිණ, එතැන් සිට එම මායිම දිගේ බටහිරට පැමිණි විට හමුවන බිම්තැඹුර, කිරලැස්ස හා කලෝගහඇළ ගම් මායිම් හමුවන ස්ථානය දක්වා ද, එතැන් පටන් බිම්තැඹුර, හා කලෝගහඇළ ගම්වලට මායිම් ගල් යොදා වෙන් කරන ලද මායිම් දිගේ උතුරු දෙසට ගිය විට හමුවන තිත්තවැල්ගොල්ල හා කලෝගහඇල පොදු ගම්මායිම දක්වා ද, එතැන් සිට කලෝගහඇළ හා තිත්තවැල්ගොල්ල පොදු මායිම (මායිම් ගල් යෙදූ මායිම දිගේ) උතුරු දෙසට ගියවිට හමුවන තිත්තවැල්ගොල්ල දොළේ මධ්‍ය රේඛාව දක්වා ද, නැවතත් එම දොළේ මධ්‍ය රේඛාව ඔස්සේ තිත්තවැල්ගොල්ල හා කාලලෝගහඇල මායිම් ගල් යොදා ඇති පොදු ගම් මායිම ඔස්සේ උතුරු දෙසට ගියවිට හමුවන තිත්තවැල්ගොල්ල, යක්කුරාගල හා කලෝගහ ඇළ පොදු ගම් මායිම් හමුවන ස්ථානය දක්වා ද, එතැන් පටන් නැවත්ත රත්මල්ගහඇළ හා යක්කුරාගල මායිම් ගල් යොදා ඇති ගම් මායිම දිගේ උතුරු දෙසට ගොස් හමුවන ඇළ දිගේ ඊසාන දෙසට යන විට හමුවන යක්කුරාගල ඔය මධ්‍ය රේඛාව දිගේ දඹුල්ල - කණ්ඩලම මාර්ගයේ මධ්‍ය රේඛාව හරහා නැවත යක්කුරාගල ඔය මධ්‍ය රේඛාව දිගේ උතුරු දෙසට දඹුල්ල - කණ්ඩලම මාර්ගය හරහා ගොස් නැවත යක්කුරාගලඔය මධ්‍ය රේඛාව දිගේ යක්කුරාගල - කණ්ඩලම ගම් මායිම හමුවන ස්ථානය දක්වා ද, එතැන් සිට මායිම් ගල් යොදා සලකුණු කරන ලද කණ්ඩලම හා රත්මල්ගහඇල ගම්මාන දිගේ ගොස් නැවත පණුගල්ගොඩඔය යක්කුරාගල ඔයට වැටෙන ලක්ෂ්‍යයට වැටී, එතැන් සිට යක්කුරාගල ඔයේ මධ්‍ය රේඛාව දිගේ උතුර දෙසට ගියවිට හමුවන මිරිස්ගෝනි ඔය මධ්‍ය රේඛාව දක්වා ද, එතැන් සිට මිරිස්ගෝනි ඔය මධ්‍ය රේඛාව දිගේ ඊසාන දෙසට ගිය විට හමුවන කණ්ඩලම ගම් මායිම දක්වා ද, එතැන් පටන් මායිම් ගල් යොදා සලකුණු කරන ලද පැල්වැහැර හා කණ්ඩලම ගම් මායිම් දිගේ වයඹ දෙසට ගොස් මහවැලි ජලමාර්ගය හරහා ගොස් නැවතත් මායිම් ගල් යොද සලකුණු

කරන ලද පැල්වැහැර හා ඉනාමළුව ගම් මායිම දිගේ උතුරු දෙසට ගියවිට හමුවන එඬෙරගල පන්සල හන්දිය හරහා දඹුල්ල - ත්‍රිකුණාමල මාර්ගයේ මධ්‍ය රේඛාව දක්වා ද, එතැන් සිට එම මාර්ගයේ නිරිත දෙසට මධ්‍ය රේඛාව දිගේ ගිය විට හමුවන සේරුගස්යාය මාර්ගයේ මධ්‍ය රේඛාව දිගේ බටහිර දෙසට ගියවිට හමුවන ප්‍රාදේශීය සභා මාර්ගයේ දකුණු දෙසට ගිය විට හමුවන මහවැලි ඇළ මාර්ගය හරහා රන්දෙණිවැව වාන වැව් කණ්ඩිය හරහා රන්දෙණි ඇළ මධ්‍ය රේඛාව දිගේ දකුණට හා බටහිරට ගියවිය හමුවන කෙත්ඇළ දක්වා ද, එතැන් සිට කෙත්ඇළ දිගේ උතුරු දෙසට ගියවිට හමුවන මහවැලි ජල මාර්ගයේ මධ්‍ය රේඛාව දිගේ උතුරු දෙසට මීටර් 2700 ක් ගියවිට බූලාගල ගමේ උතුරු මායිම ඔස්සේ බටහිර දෙසට ගියවිට හමුවන උතුරුමැද හා මධ්‍යම පළාත් මායිම දක්වා පැමිණ නැවත අනුරාධපුර හා මාතලේ දිස්ත්‍රික් මායිම දිගේ නැගෙනහිර දෙසට හා උතුරු දෙසට ගියවිට හමුවන ඉනාමළුව කඳුමුදුනේ ආරම්භක ලක්ෂ්‍යය දක්වා ද වේ.

02 - 380/1

---

**මහ නගර සභා ආඥාපනත**

නියමය

මහ නගර සභා ආඥා පනතේ (252 වැනි අධිකාරය ) 2,3, 5 සහ 9 වැනි වගන්තිවලින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍ය, ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම, මෙම නියමයෙන් -

(1) මෙහි උපලේඛනයේ I වැනි කොටසේ නිරූපිත ප්‍රදේශය එම ආඥාපනතේ කාර්යය සඳහා මහා නගරයක් විය යුතු යැයි ප්‍රකාශ කරමි.

(2) එම උපලේඛනයේ II වැනි කොටසේ දක්වා ඇති සීමා, එම මහා නගරයේ පරිපාලන සීමා ලෙස නිශ්චය කරමි.

(3) මෙම නියමයේ (1) වැනි ඡේදය යටතේ ප්‍රකාශයට පත් කරන ලද මහා නගරය සඳහා මහ නගර සභාවක් සංස්ථාපනය කර, එම මහ නගර සභාවට පහත සඳහන් නාමය සහ නිල නාමය පවරමි.

**"දඹුල්ල මහ නගර සභාව"**

(4) දඹුල්ල මහ නගර සභාව නගරාධිපතිවරයකු, උප නගරාධිපතිවරයකු සහ තෝරා පත් කරගත් වෙනත් සභිකයින් දහතුන් දෙනෙකුගෙන් සමන්විත විය යුතු යැයි තීරණය කරමි.

(5) දඹුල්ල මහ නගර සභාවේ ධුර කාලය ආරම්භ විය යුතු දිනය 2011 අප්‍රේල් මස පළමුවැනි දිනය වශයෙන් නියම කරමි.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍ය.

2010 පෙබරවාරි මස 02 වැනි .දින,
කොළඹ,
පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශයේ දී ය.

**උපලේඛනය**

***I* වැනි කොටස**

*මාතලේ දිස්ත්‍රික්කයේ, දඹුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටි පහත සඳහන් ග්‍රාම නිලධාරි කොට්ඨාසවලින් සමන්විත භූමි ප්‍රදේශය* :

(444) තිත්තවැල්ගොල්ල, (444ඒ) කපුවත්ත, (444බී) මොරගොල්ලෑව, (445) දඹුල්ල නගරය, (445ඒ) රත්මල්ගහඇල, (445බී) පොහොරන්වැව, (445සී) අතුපරයාය, (445ඩී) පහළවැව, (445ඊ) හළුඅපුල්ලනවැව, (445එෆ්) දඹුළුගම, (445ජී) යාපාගම, (450ඒ) පැල්වැහැර සහ (450බී) බුලාගල.

## *II වැනි කොටස*

*දඹුල්ල මහා නගර සභා බල ප්‍රදේශයේ මායිම් උපලේඛනය* :

***උතුරට*** **.**—උතුරුමැද හා මධ්‍යම පළාත්වල පොදු මායිම හා දඹුළුඔය මධ්‍ය රේඛාව ඡේදනය වන ලක්ෂ්‍යයේ සිට මායිම් ගල් යොදා සලකුණු කරන ලද උතුරුමැද හා මධ්‍යම පළාත් පොදු මායිම දිගේ නැගෙනහිරට ගිය විට හමුවන මිරිස්ගෝනි ඔය මධ්‍ය රේඛාව දක්වා ද, එතැන් සිට මිරිස්ගෝනි ඔය මධ්‍ය රේඛාව ඔස්සේ වයඹ දෙසට ගිය විට හමුවන හිඟුරුවැල්පිටිය සහ පහළ බූලාගල ගම් මායිම් දක්වා ද, එතැන් සිට ඊසාන දෙසට පළාත් මායිම ඔස්සේ දඹුල්ල - අනුරාධපුර ප්‍රධාන මාර්ගය හරහා ගොස්, එතැන් පටන් පළාතේ මායිම් ඔස්සේ ඊසාන දෙසට මීටර් 1700ක් ගොස් නැවත බූලාගල ගමෙහි උතුරු මායිම ඔස්සේ නැගෙනහිර දෙසට ගියවිට හමුවන මහවැලි ජල මාර්ගය දිගේ ගිනිකොණ දෙසට ගිය විට හමුවන කෙත් ඇළ ඔස්සේ දකුණු දෙසට ගියවිට හමුවන රන්දෙණිඇල මධ්‍ය රේඛාවට පැමිණ, රන්දෙණි ඇළේ මධ්‍ය රේඛාව ඔස්සේ නැගෙනහිරට දෙසට ගොස් නැවතත් එම ඇළ දිගේ ඊසාන දෙසට හමුවන රන්දෙණි වැවේ වැව් බැම්ම දක්වා ගොස් වැව් බැම්ම හා වාන හරහා ගොස් මහවැලි ජල මාර්ගය ඔස්සේ ගිනිකොණ දෙසට ගොස් හමුවන ප්‍රාදේශීය සභා මාර්ගයේ මධ්‍ය රේඛාව දිගේ උතුරු දෙසට ගොස් හමුවන සේරුගස්යාය මාර්ගයේ මධ්‍ය රේඛාව ඔස්සේ නැගෙනහිර දෙසට ගොස් හමුවන දඹුල්ල - ත්‍රිකුණාමලය මාර්ගයේ මධ්‍ය රේඛාව දක්වා ද, එතැන් පටන් දඹුල්ල - ත්‍රිකුණාමල මාර්ගයේ මධ්‍ය රේඛාව ඔස්සේ ඊසාන දෙසට ගියවිට හමුවන එඬේරගල පන්සල් හන්දියේ දී හමුවන ඉනාමළුව කෝරළේඉම දක්වා ද, එතැන් පටන් මායිම් ගල් යොදා සලකුණු කරන ලද  අ. ග. පි. 418 ඉනාමළුව හා අ.ග.පි 421 පැල්වෙහෙර පොදු මායිම  ඔස්සේ දකුණු දෙසට ගොස් මහවැලි ජල මාර්ගය හරහා ගොස් නැවත අ.ග.පි. 420 කණ්ඩලම හා අ.ග.පි 421 පැල්වෙහෙර මායිම් ගල් යොදා සලකුණු කරන ලද පොදු මායිම ඔස්සේ දකුණු දෙසට ගිය විට හමුවන කණ්ඩලම හා පැල්වෙහෙර ගම් මායිම වන මිරිස්ගෝනි ඔයෙහි මධ්‍ය රේඛාව දක්වා ද,

***නැගෙනහිරට.***—පැල්වැහැර සහ කණ්ඩලම පොදු මායිම දිගේ ගිය විට හමුවන මිරිස්ගෝනි ඔය මධ්‍ය රේඛාව ඔස්සේ නිරිත දෙසට ගියවිට හමුවන යක්කුරාගල ඔය මධ්‍ය රේඛාව දක්වා ද, එතැන් පටන්  යක්කුරාගල ඔය මධ්‍ය රේඛාව ඔස්සේ දකුණු දිසාවට ගියවිට හමුවන පණුගල්ගොඩ ඔය යක්කුරාගල  ඔයට වැටෙන ස්ථානය දක්වා ද, එතැන් සිට අ.ග.පි. 420 කණ්ඩලම හා අ. ග. පි. 424 රත්මල්ගහඇල හා යක්කුරාගල ගම් මායිම් ඔස්සේ දකුණට ගිය විට නැවත හමුවන යක්කුරාගල ඔය මධ්‍ය රේඛාව ඔස්සේ දඹුල්ල - කණ්ඩලම ප්‍රධාන මාර්ගයේ මධ්‍ය රේඛාව දක්වා ද, එතැන්  පටන් යක්කුරාගලඔය මධ්‍ය රේඛාව දිගේ නැවත දකුණට ගියවිට හමුවන ඇළ දිගේ ගිනිකොණ දෙසට ගියවිට හමුවන යක්කුරාගල හා රත්මල්ගහඇළ පොදු මායිමේ මායිම් ගල් යොදා සලකුණු කරන ලද ගම් මායිම් ඔස්සේ දකුණු දෙසට ගිය විට හමුවන තිත්තවැල්ගොල්ල සහ රත්මල්ගහඇළ ගමෙහි දකුණු මායිමේ කෙළවර දක්වා ද, එතැනින් දකුණු දෙසට පැමිණි විට හමුවන තිත්තවැල්ගොල්ල දොළෙහි මධ්‍ය රේඛාව හරහා ගොස් හමුවන කලෝගහඇළ / බිම්තැඹුර පොදු ගම් මායිම් දිගේ දකුණු දෙසට ගිය විට හමුවන බිම්තැඹුර / කලෝගඇළ සහ කිරලැස්ස ගම් මායිම් දක්වා ද පැමිණි විට හමුවන කිරලැස්ස හා කලෝගහ ඇළ මායිම් ගල් යෙදූ  පොදු මායිම් දිගේ නැගෙනහිර ගියවිට හමුවන පල්ලියගුරු හිමිකම් කියන නඩුකාරවත්ත සහ මරවනාගොඩ හිමිකම් කියන එම්. පී. එස්. වත්ත පොදු මායිම දිගේ දකුණට ගිය විට හමුවන දඹුලුඔය සිට කළුන්දෑව දක්වා දිවෙන මාර්ගයේ මධ්‍ය රේඛාව දක්වා ද,

***දකුණට*** **.**— බිම් තැඹුර/කලෝගහඇළ සහ කිරලැස්ස පොදු මායිමේ උතුරු කෙළවරේ (කළුන්දෑව මාර්ගයේ මධ්‍ය රේඛාව සිට) බටහිර දෙසට එම මාර්ගය ඔස්සේ ගිය විට හමුවන ලකී ගාමිණී සේනානායක හිමිකම් කියන දියබුබුල වත්ත සහ මරවනාගොඩ හිමිකම් කියන එම්. පී. එස්. වත්ත පොදු මායිම දිගේ දකුණට ගිය විට හමුවන මැදමුල්ල ඇළ මධ්‍ය රේඛාව දක්වා ද, එතැන් සිට මැදමුල්ල ඇළ දිගේ දඹුලු ඔය දක්වා ද, එතැන් සිට දඹුලු ඔය මධ්‍යම රේඛාව දිගේ මාතලේ දඹුල්ල ප්‍රධාන මාර්ගයේ මධ්‍ය රේඛාව දක්වා ද, (දඹුලුඔය පාලම ) එතැන් පටන් දඹුලුඔය මධ්‍ය රේඛාව දිගේ ගිය විට අක්කර 100 මාර්ගය හමුවන ස්ථානය වන ඇඹුල්අඹේ සහ කපුවත්ත ගම් මායිම් හමුවන  ස්ථානය දක්වා ද,

***බටහිරට*** **.**— කපුවත්ත සහ ඇඹුල්අඹේ ගම්වල පොදු මායිම වන දඹුලු ඔය මධ්‍ය රේඛාව දිගේ ඇඹුල්අඹේ සහ තලකිරියාගම ගමේ පොදු මායිම දක්වා ද, එතැන් පටන් දඹුළුඔයේ මධ්‍ය රේඛාව ඔස්සේ වයඹ දෙසට ඉබ්බන්කටුව ජලාශය දක්වා ද, ඉබ්බන්කටුව ජලාශය තුළ පැරණි දඹුලුඔය පැරණි වැලමිටයා ඔය හමුවන ස්ථානය දක්වා ද, එතැන් සිට ඉබ්බන්කටුව ජලාශය තුළ පැරණි දඹුලුඔය මධ්‍ය රේඛාව ඔස්සේ උතුරු දෙසට තුබාරේ සහ දඬුබැඳිරුප්ප ගම් මායිම් හමුවන ස්ථානය දක්වා ද, එතැන් පටන් ඉබ්බන්කටුව ජලාශය තුළ පැරණි දඹුළු ඔය මධ්‍ය රේඛාව දිගේ දඬුබැඳිරුප්ප සහ ආනකටාවැව ගමෙහි පොදු මායිම වන උතුරුමැද සහ මධ්‍යම පළාත් මායිම දක්වා ද, එතැන් සිට ඉබ්බන්කටුව ජලාශය තුළ වූ පැරණි දඹුළුඔය මධ්‍ය රේඛාව ඔස්සේ වන උතුරුමැද හා මධ්‍යම පළාත් මායිම දිගේ උතුරු දෙසට ගොස් දඹුළුඔය ජලාශයේ බැම්ම හරහා ගොස් නැවත දඹුලු ඔය මධ්‍ය රේඛාව දිගේ වන උතුරුමැද හා මධ්‍යම පළාත් මායිම දිගේ උතුරු දෙසට ආනකටාවැව හා හිඟුරුවැල්පිටිය ගම් මායිම හමුවන ස්ථානය දක්වා ද වේ.

02-380/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.